# විශ්වවිද්‍යාල රෝහල
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු – ස්ථිර පදනම මත

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

**සුදුසුකම්:**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
*වෛද්‍ය නිලධාරි – I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ රු.78,585.00 + අනුමත අනෙකුත් දීමනා.

## 2. වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
*වෛද්‍ය නිලධාරි – II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ.රු.64,185.00 + අනුමත අනෙකුත් දීමනා.

## 3. වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
* වෛද්‍ය නිලධාරි – ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ - රු. 60,050.00 + අනුමත අනෙකුත් දීමනා.

## 4. <u>විකිරණ ශිල්පි (රෝග විනිශ්චය)</u>

**සුදුසුකම්:**

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

III. අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී / විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

ආ. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. අ. විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

ආ. විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 - රු.(32,850 - 10 × 445 - 11 × 660 - 10 × 730 - 10 × 750 - 59,360)
* විකිරණ ශිල්පි (රෝග විනිශ්චය) MT 6 පියවර 01 හි තබනු ලැබේ.
රු.32,850.00

5. <u>ශ්‍රවණවේදී කාර්මික ශිල්පී</u>

**සුදුසුකම්:**

I. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය **5** මට්ටමට (NVQ 5) නොඅඩු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන පූර්ණ කාලීන වසර දෙකක (02) න්‍යායාත්මක හා සීමාවාසික ශ්‍රවණවේදී කාර්මික ශිල්පී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

II. ශ්‍රවණවේදී කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිව තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MA 2-1 රු.(30,310 – ( 10 × 300 - 7 × 350 - 4 × 495 – 20 × 660 - 50,940)

* ශ්‍රවණවේදී කාර්මික ශිල්පී MA 2-1 පියවර 01 හි තබනු ලැබේ.රු.30,310.00

6. <u>කාර්මික ශිල්පී (ශල්‍යාගාර)</u>

**සුදුසුකම්:**

I. a. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

b. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

II. a. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

b. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

III. a. ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බලකාය , සෞඛ්‍ය අමාත්‍යාංශය හා නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් මෙහෙයවන ලද වසර දෙකක (02) පූර්ණ කාලීන ශල්‍යාගාර කාර්මික ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම.

සහ

b. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

IV. a. තනතුරෙහි කාර්යභාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 3 - රු.(26,290 - 10 × 270 - 10 × 300 - 10 × 330 - 12 × 350 - 39,490)

* කාර්මික ශිල්පී (ශල්‍යාගාර) PL 3 පියවර 01 හි තබනු ලැබේ. රු.26,290.00

7. <u>රියදුරු</u>

**සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**ප්‍රවීණතා :**

I. මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ පැරණි රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “A” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “D” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**පළපුරුද්ද :**

I. රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

**කායික සුදුසුකම් :**

I. තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි **05** යි අඟල් **2 1/2** ක් විය යුතුය.

III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමාන වල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස සහ දකුණු ඇස **6/9** සීමාව තුළ පැවතිය යුතුය.

(ආ). වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 3 රු.(26,290 - 270 × 10 - 300 × 10 - 330 × 10 - 350 × 12 - 39,490

* රියදුරු PL 3 පියවර 01 හි තබනු ලැබේ. රු.26,290.00

**පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. මෙම තනතුරු ස්ථිර සහ වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර රාජ්‍ය සේවයෙහි රුකියාවක නියුතුව සිටි නිලධාරින් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ජායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2023.12.27 දිනට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහල වම් කෙලවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

8. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරිමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

9. අසම්පූර්ණකල ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත්‍ර සහ අදාළ අනෙකුත් විස්තර භාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

**www.kdu.ac.lk**